## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ **විවෘත** තරග විභාගය සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ඔක්තෝබර් මස කොළඹ දිස්ත්‍රික්කයේ දී** පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

- ❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Application – Recruitment Exams/ E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026, ජූනි මස 22 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2026, ජූලි මස 20 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.**

- ❖ දැනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවයේ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**1.0 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුර :**

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01 | ඉංජිනේරු සහකාර | 102 | III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් සෘජුව බඳවා ගන්නා නිලධාරීන් හට මුල් මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවාස්ථ පුහුණුවක් ලබාදෙනු ලැබේ. |

1.1 **තනතුරුවල රාජකාරි ස්වභාවය**

දෙපාර්තමේන්තු රෙගුලාසි අනුව වාරිමාර්ග ඉංජිනේරුවරයකුගේ අධීක්ෂණය යටතේ පවරනු ලබන,

- නව හෝ පවතින ගුරුත්ව / උත්සාන / ක්ෂුද්‍ර වාරිමාර්ග, ගංවතුර හා කරදිය වැලැක්වීමේ ව්‍යාපාරවල ඉදිකිරීම් / වැඩිදියුණු කිරීම් / පුනරුත්ථාපන / මෙහෙයුම් හා නඩත්තු සහ ජල පාලනය ඵලදායී ලෙස මෙහෙයවීමේ වැඩ සඳහා මූලික විමර්ශන, පූර්ණ විමර්ශනවලට අනුකූලව බිම්මැනුම් සහ මට්ටම් ගැනීම, සීමිත පරිමාණයේ සිවිල් ඉංජිනේරුමය නිර්මාණ සහ සැලසුම් පිළියෙල කිරීම, අදාළ පිඹුරුපත් පිළියෙල කිරීම, ප්‍රමාණ සමීක්ෂණය, මිල ගණන් විශ්ලේෂණය හා ඇස්තමේන්තු පිළියෙල කිරීම.
- සම්මත පිරිවිතර අනුව ප්‍රසම්පාදන ලිපිලේඛන පිළියෙල කිරීම, වැඩ අධීක්ෂණය, සංවිධානය තත්ත්ව පාලනය.
- ක්ෂේත්‍ර /වැඩබිම්වල යන්ත්‍රෝපකරණ, ඉන්ධන, ද්‍රව්‍ය හා ගබඩා කළමනාකරණය හා අදාළ ගණන්දීම.
- ක්ෂේත්‍ර /ඒකක භාර නිලධාරී, වාරිමාර්ග ව්‍යාපාරයන්හි ව්‍යාපාර කළමනාකරු ලෙස ආයතනික සංවිධාන සංවර්ධනය හා පුහුණු කිරීම, වැඩ පරිපාලකවරුන්ගේ /තාක්ෂණ සහායකවරුන්ගේ, ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ සහ කම්කරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම.
- වාරිමාර්ග ආඥාපනත හා අනෙකුත් නීති පනත් මඟින් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන රාජකාරි සම්බන්ධයෙන් ක්ෂේත්‍ර කටයුතු සහ පවරනු ලබන අනෙකුත් ඉංජිනේරුමය උපවෘත්තික කාර්යයන් කිරීම.

**2.0 බඳවා ගැනීමේ ක්‍රමය :**

2.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාව හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

2.3 වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟතාව ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව හෝ මාර්ගගතව හෝ ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

2.4 *ඍජු බඳවා ගැනීම*

i. ඍජු බඳවා ගැනීම් යටතේ බඳවා ගන්නා ලද ආධුනිකයන් හට න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ද ඇතුළත් වන සේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන සය මසක (06) පුහුණුවකින් පසුව පවත්වන න්‍යායික හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීමේ කුසලතාව මත ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලැබේ.

ii. මෙම ආධුනිකයින් ලබා ඇති එක් වසරක ක්ෂේත්‍ර පුහුණුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ සාර්ථකව ලබාගෙන ඇත්නම් බඳවා ගැනීමෙන් පසුව ආධුනිකයන් ලැබිය යුතු සය මසක (06) පුහුණු කාල සීමාවෙන් නිදහස් කරනු ලබන අතර, ඔවුන් සියලු දෙනාම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.

**3.0** **වැටුප් පරිමාණය :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.52,250-10X800-11X1,190-10X1,320-10X1,350- රු. 100,040/= වේ. (MN3-2025)

**4.0** **සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර/ තාක්ෂණික :**

4.1 ***ශ්‍රේණි -*** III **ශ්‍රේණිය**
II ශ්‍රේණිය
I ශ්‍රේණිය
විශේෂ ශ්‍රේණිය

4.2 ***තනතුරෙහි ස්වභාවය :*** මෙම පත්වීම ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකරනු ලැබේ.

**5.0** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

5.1 ඍජු බඳවා ගැනීම් යටතේ බඳවා ගන්නා ආධුනිකයින් හට III ශ්‍රේණියේ ඉංජිනේරු සහකාර විධිමත් පත්වීම් භාරගත් දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාල සීමාව තුළ පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් විය යුතු ය.

5.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුල ලබාගැනීම අනිවාර්ය වේ.

5.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්තිවල විධිවිධානවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපටිපාටික රීතිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

5.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතු ය.

**6.0** **වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

**7.0** **අවශ්‍ය සුදුසුකම් :**

7.1 ***අධ්‍යාපන සුදුසුකම් :***

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් විෂයන් එකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සමග*

පැරණි විෂයය නිර්දේශය අනුව භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය හා රසායනික විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට අදාළ විෂයන්ගෙන් එක් වරක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම;

*හෝ*

නව නිර්දේශය අනුව උසස් ගණිතය හෝ සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායනික විද්‍යාව යන විෂයයන් (03) කින් එකවරක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත් වීම.

7.2 ***වෘත්තීය සුදුසුකම් :***

I. ගල්ගමුව, කොත්මලේ වාරිමාර්ග අභ්‍යාස ආයතනයක වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

II. මොරටුව කටුබැද්ද විශ්වවිද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

III. මට්ටක්කුලිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

IV. කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මගින් පවත්වනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

V. විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල් ඉංජිනේරු) හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

VI. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත පාඨමාලාවන්ට සමාන පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

මෙම පාඨමාලා NVQ 06 මට්ටමේ විය යුතු ය.

පාඨමාලාව සම්පූර්ණ කර ඇති එහෙත් සහතිකය ලබා නොමැති අයදුම්කරුවන්ට ද අයදුම් කළ හැකි අතර, ඔවුන් එකී සහතිකය සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. නමුත් සහතිකයේ බලාත්මක දිනය ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර විය යුතු ය.

7.3 ***කායික සුදුසුකම් :***

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

7.4 ***වෙනත් සුදුසුකම් :***

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**8.0 විභාග පටිපාටිය :**

මෙම විභාගය බහුවරණ ප්‍රශ්න පත්‍රයකින් යුක්ත වන අතර සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

**8.1 විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, විශ්ලේෂණ හැකියාවන්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීමත් පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |

**9.0 අයදුම් කිරීමේ ක්‍රමය :**

9.1 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමුකරන ලද මෘදු පිටපත් හා වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක්

ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2 අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය යි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

9.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් හා අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.4 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

9.5 ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කරගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.6 සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**10.0 විභාග ගාස්තු :**

❖ විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය :-

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the facility of internet transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank Of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank Of Ceylon)ග

*සටහන :*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

**11.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව:**

11.1 විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ :-

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

12.1 අපේක්ෂකයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

**13.0 පොදු කරුණු:**

13.1 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදු වේ. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

13.2 පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු/මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක්, විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

13.3 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

13.4 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ආචාර්ය(ඉංජි). **කිත්සිරි වැලිගෙපොලගේ,**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජුනි මස 11 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

06 - 258

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

**විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026**

විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරෙහි පවත්නා පුරප්පාඩුව සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා මෙම නිවේදනයේ ඇතුලත් සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ "සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර" යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.07.10** දින වේ.

***සටහන :*** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳව සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර යොමු කිරීම ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි සියලුම හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. තවද මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. Further, the Department of Examinations will make the opportunity for the candidates to download the results of the Efficiency Bar Examination; applicable for the confirmation of appointments and grade promotions of all the officers in the Teachers' Service. The results sheet downloaded in this manner shall be submitted by the candidate to the Zonal Director of Education. The Zonal Director of Education shall get the said results sheet verified by the Provincial Ministry of Education/ Provincial Director of Education and file in the personal file of the respective officer.

IV. On the basis of those verified results, the Provincial/ Zonal Education Authorities shall take the necessary measures to confirm the appointments and promote the grades of the relevant teachers.

V. The decision of the Commissioner General of Examinations regarding the examination results shall be final.

15.0 In respect of any matter for which the provision has not been made in this notice of examination, the decision of the Secretary to the Ministry of Education shall be final.

16.0 In case of any inconsistency among the texts of this notice published in Sinhala, Tamil and English languages, the Sinhala text shall prevail.

**Nalaka Kaluwewe,**
Secretary,
Ministry of Education, Higher Education and Vocational Education.

Ministry of Education, Higher Education and Vocational Education,
"Isurupaya",
Battaramulla,
On this 17 day of June 2026.

**Schedule I**

| *District / Town* | *District / Town Number* |
|---|---|
| Colombo | 01 |
| Gampaha | 02 |
| Kalutara | 03 |
| Kandy | 04 |
| Matale | 05 |
| Nuwara Eliya | 06 |
| Galle | 07 |
| Matara | 08 |
| Hambanthota | 09 |
| Jaffna | 10 |
| Mannar | 11 |
| Vavuniya | 12 |
| Mullativu | 13 |
| Kilinochchi | 14 |
| Batticaloa | 15 |
| Ampara | 16 |
| Trincomalee | 17 |
| Kurunegala | 18 |
| Puttalam | 19 |
| Anuradhapura | 20 |
| Polonnaruwa | 21 |
| Badulla | 22 |
| Monaragala | 23 |
| Rathnapura | 24 |
| Kegalle | 25 |

06-328

## IRRIGATION DEPARTMENT

### Open Competitive Examination for the Recruitment to Post in Grade III of the Engineering Assistants' Service in the Irrigation Department under the Ministry of Agriculture, Livestock, Land and Irrigation - 2026

APPLICATIONS are hereby called from qualified citizens of Sri Lanka for the **open** competitive examination to be held for the recruitment to Post in Grade III of the Engineering Assistants' Service in the Irrigation Department under the Ministry of Agriculture, Livestock, Land and Irrigation. This examination will be conducted by the Commissioner General of Examinations in the District of Colombo in October 2026. The Director General of Irrigation has the authority to postpone or cancel this examination.

- The application has been published through "Online Application-Recruitment Exams/ E.B. Exams" under "Our Services" on the website www.doenets.lk of the Department of Examinations, Sri Lanka, and the applications can strictly be submitted online. Accepting online applications will be commenced on 22.06.2026 at 9.00 a.m. and will be ended on 20.07.2026 at 9.00 p.m.

- Applicants who are currently in Public Service/ Provincial Public Service shall hand over a copy of the application to the Head of Institution, to be attached to their Personal File. A copy of the application certified by the Head of Institution and a letter of service confirmation shall be provided when called upon for the Interview.

**1. Posts expected to be recruited**

| *Serial No.* | *Designation* | *Number of vacancies* | *Grade to be recruited* |
|---|---|---|---|
| 01. | Engineering Assistant | 102 | Recruited to Grade III. However, to officers who are recruited directly, an in-service training at the Irrigation Department will be given during the first 06 months. |

1.1. **Nature of the duties of posts**

Following duties assigned under the supervision of an Irrigation Engineer as per the regulations of the department:

- Preliminary investigations for effective operational work of constructions/ improvements/ rehabilitation/ operation and maintenance of new or ongoing gravity/ lift/ micro irrigation, flood-water and salt-water prevention schemes and of productive water controlling, surveying and leveling according to full investigations, preparing limited scale drafts and civil engineering designs, preparing relevant plans, quantity surveying, rate analysis and preparing estimates

- Preparing of procurement documents according to the standard specifications, supervision of work, quality control of the organization

- Management of machinery, fuel, materials and stores at field work sites and relevant accounting.

- Development and training of institutional organization, supervising the duties of work supervisors/ technical aides, field assistants, and labourers as the officer-in-charge of fields/units, project manager of irrigation schemes.

- Field work related to the duties assigned to the department by the Irrigation Ordinance and other Acts, and duties of other engineering sub professions.

**2. Method of recruitment**

2.1. Recruitments will be made based on the results of the written competitive examination to be conducted by the Commissioner General of Examinations and the general interview. Qualified persons will be selected from applicants who passed the written examination, by subjecting a number of passed applicants to the number of expected recruitments, to the general interview according to the merit order of their total marks.

2.2. The general interview is solely for checking the physical fitness and certificates of the applicants and no marks will be given for the interview.

2.3. Following the consent of the Director General of Irrigation, results will be issued in person or via online, to all applicants who sat for the examination.

1.4. Direct Recruitment

I. For the apprentices who are recruited under direct recruitment, seniority will be determined according to the merit order of passing the theory and practical test conducted after a training of six months (06) which includes both theoretical and practical training, as prescribed by the Irrigation Department.

II. If the one year field training obtained by these apprentices were obtained in the Irrigation Department successfully, they shall be exempted from the aforesaid six months (06) training, and they all shall be required to sit for the practical test.

**3. Salary Scale**

As per the Schedule II of the Public Administration Circular No. 10/2025, the monthly salary scale applicable for this post is Rs.52250-10x800-11x1190-10x1320-10x1350-Rs.100,040/= (MN3-2025).

**4. Service Category**- Supervisory Management Assistant /Technical

4.1. Grades - Grade III
Grade II
Grade I
Special Grade

4.2. Nature of the post - This appointment is permanent and pensionable. You shall be subjected to the policy decisions taken by the government in future, regarding the pension scheme. Contributions shall be made to the Widow/Widowers' & Orphan's pension fund.

**5. Conditions for engagement in service and service conditions:**

5.1. Apprentices, who are recruited under direct recruitment, shall be subjected to a probationary period of 03 years from the date of accepting the appointment to the Engineering Assistant Grade III and the First Efficiency Bar Examination shall be passed within the said period.

5.2. As per the Public Administration Circular No. 18/2020 and circulars incidental thereto, it is mandatory to achieve the relevant level of language proficiency within the prescribed period of time.

5.3. This appointment is subjected to the Provisions of Sections 10-12 in the Chapter II of the Establishment Codes of the Democratic Socialist Republic of Sri Lanka, Procedural Rules of Public Services Commission and other Departmental orders.

5.4. Selected applicants shall have the ability to serve in any part of the island.

**6. Age limit:**

Minimum age shall be not less than 18 years and the maximum age shall be not more than 30 years as at the closing date of applications.

**7. Required Qualifications:**

*7.1. Educational Qualifications*

Shall have passed G.C.E (Ordinary Level) Examination in six (06) subjects with Credit passes for Sinhala/Tamil, English Language, Mathematics, Science and one other subject at one sitting,

*and,*

Shall have passed G.C.E. (Advanced Level) examination with subjects relevant to the fields of Physics, Pure Mathematics, Applied Mathematics and Chemistry as per the old syllabus at one sitting,

*or*

Shall have passed G.C.E. (Advanced Level) Examination in three (03) subjects of Higher Mathematics or Combined Mathematics, Physics and Chemistry as per the new syllabus at one sitting.

7.2. *Vocational Qualifications*

I. Having obtained the certificate upon following the Diploma in Irrigation Engineering at an Irrigation Training Institute at Galgamuwa, Kotmale,

*Or*

II. Having obtained the certificate upon following the National Diploma in Technology (Civil Engineering) at the University of Moratuwa, Katubedda,

*Or*

III. Having obtained the certificate upon following the Higher National Diploma in Engineering (Civil Engineering) conducted by Sri Lanka Institute of Advance Technological Education, Mattakkuliya,

*Or*

IV. Having obtained the certificate upon following the National Diploma in Engineering Sciences (Civil- Engineering) conducted by the Institute of Engineering Technology, Katunayake,

*Or*

V. Having obtained the certificate upon following the Diploma in Technology (Civil Engineering) conducted by the Open University,

*Or*

VI. Having obtained the certificate upon following a course similar to any of above courses recognized by the University Grants Commission or the Tertiary and Vocational Education Commission.

These courses shall be of NVQ level 06.

Applicants who have completed the course but have not yet obtained the certificate are also eligible to apply and such applicants will be required to produce the relevant certificate at the interview. However, the effective date of the certificate must be prior to the closing date of applications.

7.3. *Physical Fitness:*

Every applicant shall be physically and mentally fit to serve in any part of Sri Lanka and to perform the duties of the post.

7.4. *Other Qualifications:*

i. Shall be a citizen of Sri Lanka.
ii. Applicants shall be of excellent moral character.
iii. No person who is ordained in a religious order is eligible to appear for this examination.
iv. Qualifications required for appearing for the examination for recruitment to the post are accepted as fulfilled only if the applicant has completed all the relevant qualifications in all aspect by the date mentioned in the notification for calling applications.

**8. Procedure of Examination:**

This examination consists of a question paper with multiple-choice questions and will be conducted in Sinhala, English and Tamil media. The medium applied for cannot be changed later.

| *Question paper/ Subject area* | *Duration* | *Highest Marks* | *Pass Marks* |
|---|---|---|---|
| Intelligence test | 01 Hour | 100 | 40 |

8.1. Syllabus for the examination:

| *Question paper* | *Syllabus* |
|---|---|
| Intelligence test | Knowledge of the candidate in logical and analytical thinking, decision making ability and making judgments is assessed. |

**9. Method of Application:**

9.1. Online applications shall be filled in English language only. Applicants will be notified whether the soft copy submitted online is accepted/not accepted as a valid application by the department *via* SMS sent to the mobile number used to access the system or *via* an e-mail. Before filling the online application, download the instructions sheet prepared on applying for examination. Strictly adhere to the said instructions when filling the application. Any amendment made in the application after taking a printed copy of the application will not be considered as a valid amendment. Incomplete applications will be rejected without notice.

9.2. Candidates must get their signature on the Admission Card attested and present such attested Admission Card to the Examination Supervisor on the day of the Examination. No candidate will be allowed to sit for the examination without a duly attested Admission Card.

9.3. The Commissioner General of Examinations will issue admission cards strictly online to applicants who have paid the prescribed examination fee and submitted the duly completed application on or before the closing date of applications, based on the presumption that only those who have fulfilled the qualifications mentioned in the gazette notifications have applied. Immediately after the admission cards are issued, applicants will be notified via a web notice and a short message by the Department of Examinations, Sri Lanka. If any applicant did not receive their admission card, they must inquire from the Institutional Examinations Organization Branch of the Department of Examinations, Sri Lanka, as stated in the notice. When inquiring as such, it will be more effective to send a request letter by the applicant to the e-mail address mentioned in the notice, mentioning the name of the examination applied for, full name of the applicant, National Identity Card number and address. When making such an inquiry, it will be useful to keep the printed copy of the completed application, copy of the receipt obtained by paying the examination fee at your possession to confirm any information requested by the Department of Examinations.

9.4. Issuance of an admission card to a candidate shall not be considered as an acceptance that he/she has fulfilled the qualifications to sit for the examination or for the post.

9.5. After checking the admission card and if there needed any amendments, such amendments shall be made according to the application by contacting the Department of Examinations. Requests for amendments to be made at the examination hall will not be entertained.

9.6. All applicants are required to be bound by the general examination rules and regulations stated in this *Gazette* notification.

**10. Examination fees**

- **<u>Examination fee is Rs. 1,200/=.</u>** Payment of examination fees shall be made strictly using the following methods provided by the online system.
    - I. Any Bank Credit Card;
    - II. Any Bank Debit Card with the facility of internet transactions;
    - III. Online Banking Method of Bank of Ceylon;
    - IV. Any Branch of the Bank of Ceylon.

Note -

(a) Instructions on making the payment through above methods are published in the website under the technical instructions relevant to the examination.

(b) The receipt of payment shall be acknowledged via a short message (SMS) or e-mail. The full amount of the examination fee shall be paid and, applications of the candidates who have made payments less or more than the due examination fee, will be rejected. Department of Examinations shall not bear responsibility on the errors that occur when paying the examination fees through above methods.

(c) Under no circumstances shall the examination fee be refunded or allowed to be transferred in favour of another examination.

**11. Identity of the Candidates:**

11.1. Candidates shall prove their identity to the satisfaction of the supervisor for all subjects they appear for in the examination hall. Only the following documents will be accepted for this purpose:

(i) National identity card
(ii) Valid Passport
(iii) Valid Sri Lankan Driving License

Also, examination candidates must enter the examination hall without covering the face allowing their identity to be confirmed and without covering ears to ensure that they are not wearing electronic communication devices. Applicants who do not agree will not be admitted to the examination hall. Furthermore, from the moment applicants enter the examination hall until they leave after the examination is over, they must keep their faces and ears uncovered at all times.

**12. Penalties for furnishing false information:**

12.1. If it is revealed that a candidate does not possess the required qualifications, his/her candidature will be cancelled at any stage before, during, or after the examination. If it is revealed that a candidate has submitted any false information with his /her knowledge, or if he/she has willfully suppressed any important information, actions will be taken to dismiss him/her from the public service.

**13. General Matters :**

13.1. Candidates shall be subjected to the rules and regulations imposed by the Commissioner General of Examinations for the purpose of conducting the examination. If any candidate is to violate those rules and regulations, he or she will be liable to be subjected to a punishment imposed by the Commissioner General of Examinations. The decision of the Commissioner General of Examinations regarding the results will be the final decision.

13.2. Once the appointing authority informs the appropriate date for the release of results, steps shall be taken by the Department of Examinations to issue a results sheet mentioning the marks obtained for each subject/ total marks at the written examination to all candidates who sat for the examination by post or via the website www.results.exams.gov.lk

13.3. If there is any matter not provided for in this notification, such matter and anything regarding filling these vacancies will be determined by the Public Service Commission and the Director General of Irrigation.

13.4. In case of any inconsistency among the language texts of this notification published in Sinhala, Tamil, and English languages, the Sinhala medium notification shall prevail, and actions will be taken accordingly.

DR. (ENG). KITHSIRI WELIGEPOLAGE,
Director General of Irrigation.

Irrigation Department,
Colombo 07,
On 11th June, 2026.

06-258

---

## PLANTATION AND COMMUNITY INFRASTRUCTURE

### National Institute of Plantation Management – Athurigiriya

RECRUITMENT FOR THE COURSE OF TRAINEE ESTATE ASSISTANT SUPERINTENDENT

NATIONAL Institute of Plantation Management was established under Act, No. 45 of 1979 and operates under the Ministry of Plantation and Community Infrastructure. It is the only Government institution in Sri Lanka dedicated to enhancing academic and professional qualifications for individuals engaged in, or interested in joining, the plantation sector.

Applications are invited from G.C.E. Advanced Level qualified students for the following programme for the academic year 2026/2027.

**Advanced Certificate Course in Plantation Management (ACCPM) Planter Trainee Programme (Assistant Superintendent Training)**

| | | |
|---|---|---|
| Duration | – | One year. (01) |
| Phase I | – | 06 months' full-time study |
| Phase II | – | 06 months' Plantation-based practical training. |
| Medium | – | English |
| Admission Fee | – | Phase I Rs. 400,000.00 |
| Age Limit | – | Maximum limit 22 years |

**Admission Eligibility**

Passing six (06) subjects at the G.C.E. Ordinary Level Examination in not more than two sittings, including Credit passes for English, Mathematics, and Science;

and

Passing three subjects (excluding the General English Test) at the G.C.E. Advanced Level Examination;

or

Possessing a Diploma in Agriculture from an institution recognized by the Academic Board.

**How to Apply**

Applications duly completed in accordance with the prescribed format, together with copies of relevant certificates, should be sent by registered post to the address given below to reach on or before 26.06.2026. The name of the course applied for should be clearly indicated on the top left-hand corner of the envelope. This notice is also published on www.nipm.gov.lk, and applications may also be submitted online.

**Director / Chief Executive Officer**
**National Institute of Plantation Management**
**M.D.H. Jayawardena Mawatha,**
**Athurugiriya**

For more details
011-2770232
071-9708664